*සැ. යු.*- 2023.11.03 දින පළකරන ලද අංක 2357 *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,358 - 2023 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා - 2023.11.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 596 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.*- (i) මගේ සිහින යාපනය පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2023 ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 දෙසැම්බර් මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 නොවැම්බර් මස 17 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

තිස්සමහාරාම දිසා අධිකරණයේ දී ය.

මහජන බැංකුව සිය ප්‍රධාන කාර්යාලය, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටියා වූ ද, සිය තිස්සමහාරාම ශාඛා කාර්යාලය, තිස්සමහාරාම, මහවීදිය, අංක 44 දරන තැන පිහිටියා වූ ද, මහජන බැංකුව.

නඩු අංකය : එම්.බී. 29/2017
ඇස්කීසි අංකය : 06/2023
ස්වභාවය : සාමාන්‍ය
කාර්ය පටිපාටිය : උකස්

..........................*පැමිණිලිකරු.*

*එදිරිව*

කොග්ගල මුදියන්සේලාගේ අනුර නලින් ද සිල්වා,
අංක 96/ඒ/03,
තිස්ස පාර, වීරවිල.

..........................*විත්තිකරු.*

වර්ෂ 2018 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින තිස්සමහාරාමය දිසා අධිකරණයේ මෙම නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට රුපියල් විසි හතර ලක්ෂ විසිඑක්දහස් හාරසිය දොළහයි ශත විසි එක (රු. 2,421,412.21) ක මුදල 2018.12.20 දින හෝ ඊට පෙර ලෙස පැමිණිලිකාර බැංකුවට සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන බවටත්, ඉහත සඳහන් පරිදි එකඟ වූ ආකාරයට 2018.12.20 දක්වා වැනි දිනට හෝ ඊට ප්‍රථම රුපියල් විසි හතර ලක්ෂ විසිඑක්දහස් හාරසිය දොළහයි ශත විසි එක (රු. 2,421,412.21) ක මුදල හෝ ඉන් කොටසක් හෝ නියමිත පරිදි, නියමිත දිනට හෝ එදිනට පෙර ගෙවීම විත්තිකරු විසින් පැහැර හැරියහොත් හෝ ගෙවීමට අපොහොසත් වුවහොත් එතෙක් ගෙවන ලද මුදල් අඩු කොට ඉතිරි මුදලත්, පොලියත් සහ නඩු ගාස්තුත්, විත්තිකරුගෙන් අයකර ගැනීමට පැමිණිලිකාර බැංකුවට අයිතිය ඇති බවටත්, ඉහත කී පරිදි ගෙවා අවසන් කිරීමට අපොහොසත් වුවහොත් විත්තිකරු විසින් මෙම ණය මුදලේ ආරක්ෂාව පිණිස ප්‍ර.නො. කාන්චනා අමරසිංහ මිය විසින් 2014.08.05 වැනි දින සහතික කළ අංක 1071 දරන ණය උකස්කරය මගින් බැඳ තබා ඇති විත්තිකරුට අයිති දේපල එනම්, පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපළ පිස්කල් වෙන්දේසියේ විකුණා එම මුදල හා පොලිය සහ නඩු ගාස්තු අයකර ගැනීමට විත්තිකරුට නොදන්වා ඇස්කීසි ලබා ගැනීමට පැමිණිලිකාර බැංකුවට අයිතියක් ඇති බවටත්, සමථ තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2023ක් වූ පෙබරවාරි මස 23 වැනි දින දී තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල,

වර්ෂ 2023ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රන්දුනුවත්ත අංක 35 ග්‍රාම නිලධාරී වසමේ රන්දුනුවත්ත ගමේ පිහිටියා වූ ද අංක 0014215 දරන හිමිකම් සහතිකයේ සඳහන්වන සර්වේ ජනරාල්වරයා විසින් සපයා ඇති අංක 830098 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 01 හි කැබලි අංක 01හි කැබලි අංක 51 දරන කැබැල්ලට මායිම් :-

*උතුරට* : ඉහත කී අංක 830098 දරන කැඩැස්තර සිතියමේ අංක 02 දරන මාර්ග රක්ෂිතය සහ මහා මාර්ගය ද,
*නැගෙනහිරට* : ඉහත කී අංක 830098 දරන කැඩැස්තර සිතියමේ අංක 80 දරන කැබැල්ල ද,
*දකුණට* : ඉහත කී අංක 830098 දරන කැඩැස්තර සිතියමේ අංක 79 දරන කැබැල්ල ද,
*බස්නාහිරට* : ඉහත කී අංක 830098 දරන කැඩැස්තර සිතියමේ අංක 52 දරන කැබැල්ල ද,

යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0445 ක් විශාල ඉඩම සහ ඊට අයිති වැව්ලි, ගොඩනැගිලි යන ආදී සෑම සියලු දෙත් වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25%ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
තිස්සමහාරාමය.

වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින දී ය.

11-179

---

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

### හම්බන්තොට දිසා අධිකරණයේ දී ය.

මහජන බැංකුව සිය ප්‍රධාන කාර්යාලය, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටියා වූ ද, සිය තිස්සමහාරාම ශාඛා කාර්යාලය, තිස්සමහාරාම, මහවීදිය, අංක 44 දරන තැන පිහිටියා වූ ද, මහජන බැංකුව.

නඩු අංකය : එම් 1394
ඇස්කීසි අංකය : 17/2023
ස්වභාවය : සාමාන්‍ය
කාර්ය පටිපාටිය : උකස්

..........................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. හිතනාදුර හංසි සුභාෂිණී ද සිල්වා,
    පල්ලෙමලල, වැලිගත්ත.
02. හැන්නදි ගමගේ පියසිරි ඩැනිස්ටර් ද සිල්වා,
    පල්ලෙමලල, වැලිගත්ත.

..........................*විත්තිකරුවන්.*

වර්ෂ 2017ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දින තිස්සමහාරාමය දිසා අධිකරණයේ මෙම නඩුවේ ඇතුළත් කරන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුව එකී 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට රුපියල් විසි හතර ලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය අනූහයයි ශත හැත්තෑ හතර (රු. 2,474,496/74) ක මුදලක් ගෙවීමට එකඟවන බවත්, එම මුදල භාරගැනීමට පැමිණිලිකාර බැංකුව එකඟවන බවටත්, ඉහත කී ණය මුදල සඳහා රුපියල් දෙලක්ෂ හැත්තෑතුන් දහසක් (රු. 273,000.00) ක මුදලක් 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට මීට පෙර ගෙවා ඇති බවට පැමිණිලිකාර බැංකුව පිළිගන්නා අතර, එම රුපියල් දෙලක්ෂ හැත්තෑතුන් දහස (රු. 273,000.00) ක මුදල 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් ගෙවිය යුතුව තිබූ මුදලෙන් හා පොළියෙන් මීට පෙර අයකර ඇති බව 01 වන හා 02 වන විත්තිකරුවන් පිළිගන්නා බවටත්, ඉහත කී රුපියල් විසි හතර ලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය අනූහයයි ශත හැත්තෑ හතර (රු. 2,474,496/74) ක මුදල රුපියල් විසිදහස (රු. 20,000.00) බැගින් වූ අඛණ්ඩ මාසික වාරික 123 කින් 2017.09.15 වැනි දින සිට 2027.12.15 වැනි දින දක්වා අතර කාලය තුළ දී 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවන බවට 01 වන හා 02 වන විත්තිකරුවන් පොරොන්දුවන බවටත්, ඒ ආකාරයෙන්ම එම මුදල භාර ගැනීමට පැමිණිලිකාර බැංකුව එකඟ වූ බවටත්, මාසිකව වාරික ගෙවීම 2017 සැප්තැම්බර් මස 15 වැනි දින සිට ආරම්භවන අතර ඉන් ඉදිරියට එළඹෙන සෑම මසකම 15 වැනි දින හෝ ඊට පෙර 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් රුපියල් විසිදහස

(රු. 20,000.00) ක මුදල පැමිණිලිකාර බැංකුව වෙත ගෙවිය යුතු බවටත්, තව ද, ඉහත කී රුපියල් දහහතර දහස් හාරසිය අනූ හයයි ශත හැත්තෑ හතර (රු. 14,496.74) ක මුදල 2017.12.15 දිනට පෙර ඉහත කී මාසික වාරික තැන්පත් කරන අතර තුළදීම 01 වන හා 02 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවන බවට 01 වන සහ 02 වන විත්තිකරුවන් පොරොන්දු වූ බවටත්, ඒ ආකාරයෙන්ම එම මුදල භාර ගැනීමට පැමිණිලිකාර බැංකුව එකඟ වූ බවටත්, ඉහත කී ආකාරයට 2017.09.15 වැනි දින සිට මාස්පතා ගෙවිය යුතු රුපියල් විසිදහස (20,000.00) බැගින් වූ මාසික වාරික 123න් කිනම් හෝ වාරික 02ක් හෝ අවසන් වශයෙන් ගෙවිය යුතු රුපියල් දහහතර දහස් හාරසිය අනූ හයයි ශත හැත්තෑහතර (රු. 14,496.74) ක මුදල හෝ ඉන් කොටසක් හෝ නියමිත පරිදි නියමිත දිනට හෝ එදිනට පෙර ගෙවීම 01 වන සහ 02 වන විත්තිකරුවන් විසින් පැහැර හැරියහොත් හෝ ගෙවීමට අපොහොසත් වුවහොත් එතෙක් ගෙවන ලද මුදල් අඩුකොට ඉතිරි මුදලත්, පොළියත් සහ නඩු ගාස්තුත් 01 වන සහ 02 වන විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට පැමිණිලිකාර බැංකුවට අයිතිය ඇති බවට 01 වන සහ 02 වන විත්තිකරුවන් පැමිණිලිකාර බැංකුව සමග එකඟ වී පොරොන්දුවට බැඳුනු බවටත්, ඉහත කී පරිදි ගෙවා අවසන් කිරීමට අපොහොසත් වුවහොත් 01 වන සහ 02 වන විත්තිකරුවන් විසින් මෙම ණය මුදලේ ආරක්ෂාව පිණිස ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් 2011.07.07 වැනි දින සහතික කළ අංක 5882 දරන ණය උකස්කරය මඟින් බැඳ තබා ඇති 02 වන විත්තිකරුට අයිති දේපල එනම් පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා එම මුදල සහ පොලිය අයකර ගැනීමට 01 වන සහ 02 වන විත්තිකරුවන්ට නොදන්වා ඇස්කීසි ලබා ගැනීමට පැමිණිලිකාර බැංකුවට අයිතියක් ඇති බවටත්, 01 වන සහ 02 වන විත්තිකරුවන් එකඟවන බවටත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත. එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් 2023 ක් වූ 10 වන මස 11 වැනි දින දී තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපල,

**වර්ෂ 2023ක් වූ දෙසැම්බර් මස 06 වැනි දින පෙ. ව. 11.00 ට** ඉහත නම් සඳහන් විත්තිකරුවන්ගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හම්බන්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, පල්ලෙමළල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලෙමළල නැමති ගමෙහි පිහිටි "**වැංකිවල ළඟ ඉඩම නැමැති ඉඩමේ ලොට් 01 දරන ඉඩම** *හෙවත්* **පල්ලෙමළල වැංකිවල ළඟ ඉඩම**'' බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. එස්. කේ. වික්නරාජා මහතා විසින් මැන බෙදා වෙන් කර 2010.06.19 වැනි දින සම්පාදිත අංක 2010/947 දරන පිඹුරේ B 2 දරන ඉඩමට එකී පිඹුර ප්‍රකාර මායිම්,

*උතුරට* : වැංකිවල ළඟ ඉඩම සහ අංක 2009/662 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම ද,

*නැගෙනහිරට* : අංක 2009/662 දරන පිඹුරේ ලොට් A දරන ඉඩම සහ මාර්ග රක්ෂිතය සහ හම්බන්තොට සිට වීරවිල දක්වා වන ප්‍රධාන මාර්ගය ද,

*දකුණට* : මාර්ග රක්ෂිතය සහ හම්බන්තොට සිට වීරවිල දක්වා වන ප්‍රධාන මාර්ගය සහ අංක 2010/947 දරන පිඹුරේ B 1 දරන ඉඩම ද,

*බස්නාහිරට* : 2010/947 දරන පිඹුරේ B 1 දරන ඉඩම සහ ටී. පී. 244947 දරන ඉඩම සහ වැංකිවල ළඟ ඉඩම ද, යන සතර මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුන (රූ. 1, පර්. 3) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි යනාදී සෑම සියලු දෙය ද, එකී ඉඩමට ප්‍රවේශ වීමට ඇති ප්‍රවේශ මාර්ගයන් හි මාර්ග අයිතිවාසිකම් ද වේ. මෙම ඉඩම හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 95/207 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25%ක් එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
හම්බන්තොට.

වර්ෂ 2023 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින දී ය.

11-180

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.